සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 06 /2025

මගේ අංකය: PPSC/ES/14/FI/06/27
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය - රත්නපුර
2025.02.27

පළාත් ආදායම් කොමසාරිස්
සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
ස.පස.

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි ක්ෂේත්‍ර ගත/කාර්යාලගත ඛණ්ඩ 2 සේවා ගණයේ II ශ්‍රේණියේ බදු නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2025 අප්‍රේල්**

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ ක්ෂේත්‍ර ගත/කාර්යාලගත ඛණ්ඩ 2 සේවා ගණයේ II ශ්‍රේණියේ බදු නිලධාරීන් ලෙස සේවය කරන සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02.විභාගය සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාත් ආදායම් සේවයේ **II වන ශ්‍රේණියේ බදු නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.**

03. **මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ** www.psc.sg.gov.lk **හා සබරගමුව පළාත් වෙබ් අඩවියට** www.sg.gov.lk යොමු කර ඇත.

04. සේවා ව්‍යවස්ථාවට අනුව මෙම විභාගයේ විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| සාමාන්‍ය බදු දැනීම | **1990 අංක 6 දරණ මුදල් ප්‍රඥප්තියෙන් පනවා ඇති පිරිවැටුම් බද්ද,මුද්දර ගාස්තුව සහ ලොතරැයි බද්ද ඇතුළු ව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලබන බදු හා ගාස්තු පිළිබඳ එක් ප්‍රශ්න පත්‍රයක්** | පැය 02 | 100 | 40% |

***සටහන:-*** **සාමාර්ථය සඳහා එක් විෂයකට 40%කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය.**

05. මේ අනුව මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය නිලධාරීන් මීට අමුණා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාර අයදුම්පත් තම පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් **2025.03.25** දිනට ප්‍රථම ලැබෙන සේ මා වෙත එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. මීට පෙර මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට එම අවස්ථාවල දී විභාගය අසමත් වී නැවත අයදුම් කරන්නේ නම් සමස්ත විභාගය සඳහා රු 600/-ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය. එම විභාග ගාස්තුව මෙම පළාත් සභාවේ අමාත්‍යාංශ කාර්යාලයකට/දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන අයතන හැර) ගෙවිය යුතු ය.එසේ ගෙවන විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** ආදායම් ශීර්ෂයට බැර වන සේ ගෙවා ලබා ගන්නා ලදුපත, අයදුම්පත්‍රයේ පසුපිටෙහි නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

07. මෙම විභාගය **2025 අප්‍රේල් මාසයේදී** පැවැත්වීමට නියමිත අතර පවත්වන දිනය, ස්ථානය අපේක්ෂකයන්ට විභාග ප්‍රවේශ පත්‍ර මගින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

08. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. <u>**අයදුම්කරුවන් ඉදිරිපත්ව නොමැති නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් මා දැනුවත්**</u> කරන මෙන් කාරුණිකව දන්වමි.

09. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඩබ්.ආර්.දිනීෂා එස්.රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

<u>පිටපත්</u>

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා හා කාරුණික දැනගැනීම සඳහා

# ආදර්ශ අයදුම්පත්‍රය

සිංහල - 01
දෙමළ - 02
(පෙනී සිටින භාෂා මාධ්‍යය අංකය කොටුවේ සඳහන් කරන්න )

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි ක්ෂේත්‍ර ගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ II ශ්‍රේණියේ බඳු නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 අප්‍රේල්**

01. (a) මුලකුරු සමඟ නම:-
..........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (මුලකුරු අගට යොදන්න. උදා:- SILVA A.B.)

(b) මුලකුරු සමඟ නම:-
..........................................................................................................................

(c) රාජකාරී ලිපිනය:-
..........................................................................................................................
..........................................................................................................................
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(d) ස්ත්‍රී / පුරුෂ භාවය:-......................................................................
(e) දුරකථන අංකය පුද්ගලික :- ..........................................................
රාජකාරී :- ..........................................................................
(f) මෙම කාර්යක්ෂමතා විභාගයට පෙනී සිටින වාරය:-
..........................................................................................................
(g)පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයයන්-1)..................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03. ඔබ II ශ්‍රේණියේ බඳු නිලධාරී ලෙස පත් වූ දිනය:-........................................................

04. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:-
.........................................................
(අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන)

---

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති/නැති අයෙකු බවත් මා ඉදිරිපිටදී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බවත් මින් සහතික කරමි.
(නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න.)

.................................................
දිනය :-
පළාත් ආදායම් කොමසාරිස්
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

---

මෙම අයදුම්පත්‍රය නිර්දේශ කරමි/නොකරමි.(නිර්දේශ නොකරන්නේ නම් හේතුව සඳහන් කරන්න.)

.......................................
දිනය

.......................................................
ප්‍රධාන ලේකම්/ප්‍රධාන ලේකම් වෙනුවට
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)